# ග්‍රාමීය පාසල්වල අ.පො.ස. සාමාන්‍ය පෙළ සිසුන්ගේ විද්‍යාව විෂයය සාධනය කෙරෙහි බලපාන සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

(දෙනියාය අධ්‍යාපන කලාපයේ පස්ගොඩ අධ්‍යාපන කොට්ඨාසය ඇසුරෙනි)

විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනපති පශ්චාත් උපාධි අවශ්‍යතා පූර්ණය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනයකි.

VERIFIED

විරෝෂා ජයවර්ධන

අධ්‍යාපනපති පශ්චාත් උපාධි පාඨමාලාව

ද්විතීය හා තෘතීය අධ්‍යාපන අංශය,

අධ්‍යාපන පීඨය,

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය,

2013 නොවැම්බර්

29 MAY 2014

OPEN UNIVERSITY

70889

70889

# සංක්ෂේපය


අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේ විද්‍යාව විෂයයේ ප්‍රතිඵල අධ්‍යයනය කළ විට නාගරික ප්‍රදේශවලට සාපේක්ෂ ව ග්‍රාමීය ප්‍රදේශවල සිසුන්ගේ විද්‍යාව විෂයය සාධන මට්ටම පැහැදිලි විෂමතාවක් ඇති බව පෙනීගොස් ඇත. මේ සඳහා බලපාන සාධක අනාවරණය කර ගැනීම සඳහා පර්යේෂකයා **ග්‍රාමීය පාසල්වල අ. පො. ස. සාමාන්‍ය පෙළ සිසුන්ගේ විද්‍යාව විෂයය සාධනය කෙරෙහි බලපාන සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්** සිදු කරන ලදී. මෙම පර්යේෂණයේ මූලික අරමුණු වූයේ, **ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ අ. පො. ස. සාමාන්‍ය පෙළ විද්‍යාව විෂයය සාධන මට්ටම හඳුනා ගැනීම, ග්‍රාමීය පාසල්වල අ. පො. ස. සාමාන්‍ය පෙළ විද්‍යා විෂයය සාධනය කෙරෙහි බලපාන ශිෂ්‍යයා සම්බන්ධ සාධක අනාවරණය කිරීම, ග්‍රාමීය පාසල්වල අ. පො. ස. සාමාන්‍ය පෙළ විද්‍යාව විෂයය සාධනය කෙරෙහි බලපාන පාසල සම්බන්ධ සාධක හඳුනා ගැනීම හා ග්‍රාමීය පාසල්වල අ. පො. ස. සාමාන්‍ය පෙළ විද්‍යාව විෂයය සාධන මට්ටම ඉහළ නැංවීමට යෝජනා ඉදිරිපත් කිරීමයි.**

පර්යේෂණ ක්‍රමවේදය ලෙස තෝරා ගනු ලැබුවේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම දෙකෙහි මිශ්‍ර ප්‍රවේශයකි. මෙහි දී සමීක්ෂණ ක්‍රමය ප්‍රධාන පර්යේෂණ ක්‍රමය ලෙස භාවිතා කරන ලදී. නියැදිය සඳහා දෙනියාය අධ්‍යාපන කලාපයේ පස්ගොඩ අධ්‍යාපන කොට්ඨාසය ඇසුරෙන් පර්යේෂකයාට ප්‍රවේශය පහසු පරිදි 1AB වර්ගයේ හා 1C වර්ගයේ පාසල් එක බැගිනුත්, 2 වර්ගයේ පාසල් තුනකුත් තෝරා ගන්නා ලදී. එම පාසල් 5න් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 94 ක් හා විද්‍යාව විෂයය භාර ගුරුවරුන් 8ක් නියැදියට ඇතුළත් කර ගන්නා ලදී. මීට අමතර ව විද්‍යාව විෂයය අධ්‍යක්ෂවරයා හා විද්‍යාව ගුරු උපදේශකවරයා ඇතුලුව පුද්ගලයන් 104ක නියැදියකින් දත්ත ලබා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස මූලික වශයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට විවෘත හා සංවෘත ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්නාවලි ලබා දුන් අතර විද්‍යාව ගුරුවරු, විද්‍යාව විෂයය අධ්‍යක්ෂ හා ගුරු උපදේශකවරුන්ගෙන් තොරතුරු ලබා ගැනීමට විධිමත් හා අවිධිමත් සම්මුඛ සාකච්ඡා පැවැත් වීමත්, පසුගිය වාර විභාග ලකුණු ලයිස්තු පරිශීලනයත්, පාසලේ සම්පත් පිළිබඳ අධ්‍යයනයට පිරික්සුම් ලයිස්තුවක් භාවිතා කිරීමත්, වැඩිදුරටත් තොරතුරු ලබා ගැනීමට විධිමත් ව හා අවිධිමත් ව නිරීක්ෂණය කිරීමත් සිදු කරන ලදී. මෙසේ ලබාගත් දත්ත උචිත පරිදි ගුණාත්මක ව හා ප්‍රමාණාත්මක ව විශ්ලේෂණය සිදු කරන ලදී.

විශ්ලේෂිත දත්ත ඇසුරෙන් එක් එක් අරමුණට අදාල ව මතු දැක්වෙන නිගමනවලට එළඹ ඇත.

1. **ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ විද්‍යාව විෂයය සාධන මට්ටම පහළ මට්ටමක පවතී. එයින් ද 1C හා 2 වර්ගයේ පාසල්වල විද්‍යාව විෂයය සමත් වන ප්‍රතිශතය අඩු මට්ටමක ( 50% ට අඩු හෝ ආසන්න මට්ටමක) පවතී.**
2. **ග්‍රාමීය පාසල්වල සිසුන් බහුතරයකට පහත් සමාජ, ආර්ථික හා අධ්‍යාපන මට්ටමක් ඇති පවුල් පරිසරයක් ඇත. ඔවුන්ට විද්‍යා අංශයෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබීමට අපේක්ෂාවක් , රුචිකත්වයක් හෝ පෙළඹවීමක් නැත. මෙම හේතු ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ විද්‍යාව විෂයය සාධන මට්ටම අඩුවීමට හේතු වී ඇත.**
3. **2 වර්ගයේ ග්‍රාමීය පාසල්වල භෞතික සම්පත් ඌණතාව සිසුන්ගේ විද්‍යාව විෂයය සාධන මට්ටම අඩුවීමට හේතුවක් වී ඇත. එම පාසල්වල විද්‍යාගාර පහසුකම් හා පුස්තකාල පහසුකම් කිසිසේත් ප්‍රමාණවත් නොවේ. සා. පෙළ විද්‍යාව විෂයය නිර්දේශයේ විෂයය අන්තර්ගතය වැඩිවීම හා විෂයය කරුණු සංකීර්ණ වීම විෂයය නිර්දේශය නියමිත කාලය තුළ ආවරණය කිරීමට නොහැකි වීමට හේතු වන අතර එය සිසුන්ගේ විද්‍යාව විෂයය සාධන මට්ටම අඩුවීමට හේතු වී ඇත. පාසල තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ ගැටලු පවතී. එවා නම්, ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යොදා නොගැනීම, නවීන තාක්ෂණික ක්‍රම භාවිතා නොකිරීම හා අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය ඵලදායීව ක්‍රියාත්මක නොවීමයි.**

   මෙම අධ්‍යයනයෙන් අනාවරණය කරගත් කරුණු ග්‍රාමීය පාසල්වල අ. පො. ස. සාමාන්‍ය පෙළ සිසුන්ගේ විද්‍යාව විෂයය සාධන මට්ටම ඉහළ නැංවීමට පියවර ගැනීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කරමි.

## Abstract

It is identified that there is a clear difference in achievement levels of subject Science between the students of rural schools and urban schools. The focus of this research is to identify the factors that affect the achievement of subject Science of GCE O / L students in rural areas. The objectives of this research were to identify the science achievement level of GCE O/L students in rural areas, identify the students related factors affecting on science achievement level, identify school related factors affecting on science achievement level, identify the factors that affect the achievement of subject Science of GCE O / L students in rural areas and suggest proposals to enhance the science achievement level in rural schools.

Mixed research approach was used, and therefore data were collected through both Qualitative and Quantitative methods. Servey methord used as main research approach. The sample was a purposive sample selected for the convenience of the researcher. The sample is consisted with one 1AB school, one 1C school and three schools of type 2 in Pasgoda Educational Division of Deniyaya Educational Zone. The sample includes 94 students and 8 science teachers of the 5 schools, science director and science instructor. The main data collecting instruments were questionnaires that forward to the students and teachers. Interviews were also carried out to collect data from science teachers, science director and science instructor. In addition observation schedule and students mark sheets of past term tests were used to collect data. Data are presented in tables and analyzed qualitatively (using statistic techniques) and quantitatively (by explaining) in fourth chapter.

The findings suggested that the science achievement level of GCE O / L students in rural areas are in low level. Further, it was identified that in type 1C and type 2 schools the achievement level in subject Science is less than 50% (i.e. the students who pass Science in GCE O/ L

examination). Data revealed that since most of the students in rural areas have low level of social economic status and low educational level of family back ground. They do not have higher expectations, or motivation to continue their higher education in Science subjects. Also lack of the physical resources in the schools were another reason identified for low science achievement level, especially in type 2 rural schools. These schools do not have enough laboratory facilities or library facilities. In addition, the incompletion of the syllabus of the subject Science due to the complexity of the subject matter is another identified factor for low achievement In GCE O/L in Science in rural schools. The weaknesses in teaching and learning process, for example, lack of using effective teaching and learning methods, lack of using modern technology and lack of effective school internal observation process are also identified as other factors affecting the Science Achievement. I think the findings of this research may be useful to get actions to increase the science achievement level of the students in rural schools.